කාර්ය සාධන වාර්තාව

2024 - දෙවන කාර්තුව

2024

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

දැක්ම

සුපිළිපන්නබව දිරි ගැන්වෙන සහ යුක්තිය තහවුරු කෙරෙන දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක්

මෙහෙවර

නීතිය සවිමත් ව බලාත්මක කිරීම, නිවාරණ යාන්ත්‍රණයන් හා විනිවිදබව සහිත පාලනයක් තුලින් දූෂණය තුරන් කිරීම සහ එමගින් සවිමත් ආර්ථිකයක් ඇති කිරීමට සහය වීම මෙන් ම සියලු ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා දේශයේ සම්පත් සුරැකීම

අන්තර්ගතය	පිටු අංකය
හැඳින්වීම	01
පැමිණිලි යොමුවීම	04
විමර්ෂණ හා වැටලීම්	06
නඩු පැවරීම සහ මෙහයවීම	07
නිවාරණය	10
මානව හා භෞතික සම්පත් කළමනාකරණය	13

01. හැඳින්වීම

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ විධි විධාන අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිහිටුවනු ලැබ ඇති අතර, පනතේ 3(2) උප වගන්තිය අනුව මෙය අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වන බව දක්වා ඇත. එමෙන්ම කොමිෂන් සභාවට පනත මගින් පැවරී ඇති බලතල හෝ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී නීතිය යටතේ හිමිකම් ලැබූ අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් මගින් හැර වෙනත් කිසිදු මැදිහත්වීමකට යටත් නොවී ස්වාධීනව කටයුතු සිදුකළ යුතු බව 3(4) උප වගන්තිය මගින් දක්වා ඇත.

1.1 කොමිෂන් සභාවේ සංයුතිය

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 4(1) උප වගන්තිය අනුව, නීතිය පිළිබඳ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්දක් සහිත ප්‍රවීණ හා විශිෂ්ඨත්වයට පත්වූ එක් තැනැත්තෙකු හා

I. අපරාධ විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම
II. වෝහාරික විගණනය
III. වෝහාරික ගිණුම්කරණය
IV. ඉංජිනේරු විද්‍යාව
V. ජාත්‍යන්තර සම්බන්ධතා සහ රාජ්‍ය තාන්ත්‍රික සේවා
VI. මහජන කටයුතු කළමනාකරණය
VII. රාජ්‍ය පරිපාලනය

යන සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රවීණ, විශිෂ්ටත්වයට පත් සහ අවම වශයෙන් අවුරුදු 20 ක පළපුරුද්දක් සහිත තැනැත්තන් දෙදෙනෙකු ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ සාමාජිකයින් ලෙස ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබේ.

ඒ අනුව,

- හිටපු අභියාචනාධිකරණ විනිසුරු හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය මහලේකම් විනිසුරු ඩබ්.එම්.එන්.පී. ඉද්දවල මහතා - සභාපති
- ජ්‍යෙෂ්ඨ බැංකු කරුවෙකු වන මහජන බැංකුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කේ.බර්නාඩ් රාජපක්ෂ මහතා - සාමාජික
- අතිරේක සොලිස්ටර් ජනරාල් ජනාධිපති නීතිඥ චේතිය ගුණසේකර මහතා - සාමාජික

යන සාමාජිකයින් තිදෙනා 2024 ජනවාරි මස 01 වන දින සිට රාජකාරී ආරම්භ කරන ලදී.

1.2 කොමිෂන් සභාවේ කාර්යභාරය


1. 2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ වූ වැරදි සම්බන්ධයෙන් ලැබෙන ලැමිණිලි සඳහා සාධාරණ විමර්ශන සිදුකිරීම, ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වන පැමිණිලි සඳහා නියමිත අධිකරණයන්හි නඩු පැවරීම සහ අධිකරණ වල එම නඩු මෙහෙයවීම.
2. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම පිළිබඳ මධ්‍යම අධිකාරිය වශයෙන් ක්‍රියා කිරීම.
3. දූෂණය වැලැක්වීම සඳහා ශ්‍රී ලංකා විසින් එළඹ ඇති ජාත්‍යන්තර සම්මුති, ගිවිසුම් සහ බැඳීම් ක්‍රියාත්මක කිරීම.
4. දූෂිත ක්‍රියා පිළිබඳව මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම.
5. දූෂණ විරෝධී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම.
6. දූෂණ ක්‍රියා අනාවරණය කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන වල නීති, පරිචයන් සහ කාර්ය පටිපාටි පරීක්ෂා කිරීම.
7. දූෂණය තුරන් කිරීම සඳහා රාජ්‍ය හෝ පුද්ගලික ආයතන වෙත මගපෙන්වීම සහ නියෝග ලබාදීම.
8. දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීම.
9. කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවා නියුක්තයන්ගේ පත්වීම්, උසස් වීම් සහ විනය පාලනය සම්බන්ධ කටයුතු

1.3 2024 ජනවාරි මස 01 වන දිනට පෙර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

1954 අංක 11 දරණ අල්ලස් පනත මගින් ස්ථාපනය කරන ලද අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව අහෝසි කරමින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 1994 අංක 19 දරණ පනත යටතේ පිහිටවූ අතර එය 1994 දෙසැම්බර් මස 15 වන දින සිට ක්‍රියාත්මක විය. 2023 අංක 09 දරණ දූෂණ විරෝධී පනත යටතේ අල්ලස හා දූෂණය මැඩලීම සම්බන්ධව කොමිෂන් සභාව තවදුරටත් බලාත්මක කරන ලද අතර, 2024 ජනවාරි මස 01 වන දින සිට නව සාමාජිකයින් යටතේ කොමිෂන් සභාව ක්‍රියාත්මක වේ.

1.4 කොමිෂන් සභාවේ ව්‍යුහය

වර්තමානය වන විට කොමිෂන් සභාවේ කටයුතු සිදුවන සංවිධාන ව්‍යුහය පහත පරිදි වන අතර, දූෂණ විරෝධී පනත මඟින් පෙර පැවැති පනත් වලට අමතරව පැවරුණු රාජකාරි හා වගකීම් ඉටුකිරීමට අදාලව කොමිෂන් සභාව ප්‍රතිසංවිධානය සිදුකරනු ලබන අතර, එම කටයුතු වලින් අනතුරුව කොමිෂන් සභාවේ ව්‍යුහය සංශෝධනය වීමට නියමිතය.



02. පැමිණිලි යොමුවීම

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත, අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් වන පැමිණිලි පහත ක්‍රම මඟින් යොමු කිරීමට හැකියාව ඇත.

- 1954 දුරකතන අංකයට ඇමතීම මඟින්
- Fax පණිවිඩ මඟින්
- විද්‍යුත් තැපෑල මඟින්
- අතින් ගෙනැවිත් භාරදීමෙන්
- කාර්යාලීය ලිපිනයට නාමිකව හෝ නිර්නාමිකව යොමුකරන ලිපි මඟින්


2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත සම්මත වීමෙන් පසු ජනතාව අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් දක්වන උනන්දුව වැඩිවීම හා දූෂණ නිවාරණ ඒකකය මඟින් රටපුරා පවත්වනු ලබන වැඩසටහන් තුළින් ප්‍රජාවගේ දැනුවත්භාවය ඉහළ යාම හේතුවෙන්, අල්ලස් හා දූෂණ සම්බන්ධයෙන් පෙර වර්ෂ වලදී ලද පැමිණිලි වලට සාපේක්ෂව 2024 වර්ෂයේ දී ලද පැමිණිලි වල වැඩි වර්ධනයක් පෙන්නුම් කරයි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමුවන පැමිණිලි, කොමිෂන් සභාවේ ලේකම් අංශය මඟින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාව වෙත යොමුකරනු ලබන අතර, එහිදී අල්ලස් පනතට අදාල නොවන හා ප්‍රමාණවත් කරුණු අනාවරණය නොවන පැමිණිලි විමර්ශනය සඳහා භාජනය නොකිරීමට කොමිෂන් සභාව තීරණය කරනු ලබයි. 2014 වර්ෂයේ සිට 2024 ජුනි දක්වා ලද පැමිණිලි හා ඉන් විමර්ශනයට යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාවන් පහත පරිදි වේ.

ලද පැමිණිලි හා විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි 2014- 2024 ජුනි

වර්ෂය	ලද පැමිණිලි සංඛ්‍යාව	විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි සංඛ්‍යාව**
2014	2,345	863
2015	3,964	1,823
2016	3,450	2,435
2017	2,768	1,573
2018	3,465	2,086
2019	3,305	2,020
2020	2,764	1,909
2021	2,335	892
2022	2,512	921
2023	3,431	1,152
2024 ජුනි දක්වා	2,142	616

** වැටලීම් සඳහා ලද පැමිණිලි හැර



විමර්ශනය කිරීමට නියෝග කරනු ලබන පැමිණිලි කොමිෂන් සභාවේ විමර්ශන අංශයට යොමුකරනු ලබන අතර, වෙනත් ආයතන වලින් වාර්තා කැඳවීමට හා විමර්ශන ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳව සලකා බැලීමට නීති වාර්තා කැඳවීම අවශ්‍ය වන පැමිණිලි සම්බන්ධව අදාළ කටයුතු කොමිෂන් සභාවේ ලේකම් අංශය මගින් සිදුකරනු ලැබේ.

කොමිෂන් සභාව සමග සම්බන්ද විය හැකි ආකාරය

ක්ෂණික ඇමතුම්	: 1954
විද්‍යුත් ලිපිනය	: ciaboc_gen@ciaboc.gov.lk
ෆැක්ස්	: 0112596360
ලිපිනය	: 36, මල්ලලසේකර මාවත, කොළඹ 07

කොමිෂන් සභාව වෙත පුද්ගලිකව පැමිණීමෙන්ද, පැමිණිලි කළ හැක

03. විමර්ශන සහ වැටලීම්

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනත යටතේ දක්වා ඇති වැරදි සම්බන්ධ විමර්ශන කටයුතු කොමිෂන් සභාවේ විමර්ශන අංශය මගින් සිදුකරනු ලැබේ. පනතේ 42 වගන්තිය ප්‍රකාරව,

- යම් තොරතුරක් ලැබීමෙන් පසුව
- පැමිණිල්ලක් ලැබීමෙන් පසුව
- කොමිෂන් සභාවේ අවශ්‍යතාවය අනුව හෝ
- කොමිෂන් සභාව වෙත ලැබෙන වෙනත් යම් වැදගත් දෙයක් මත පදනම්ව

මූලික පරීක්ෂණයක් ආරම්භ කළ හැකි වේ. එහිදී පනතේ 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාව සෑහීමට පත්වේ නම්, විමර්ශනයක් පැවැත්වීමට තීරණය කළ හැක. එසේ වුවද, 41 වන වගන්තියේ සඳහන් වරදක් සිදුකර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම් මූලික පරීක්ෂණයක් පැවැත්වීමෙන් තොරව විමර්ශනයක් පැවැත්වීමට ද කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

3.1 විමර්ශන කටයුතු

කොමිෂන් සභාව විසින් 2024.01.01 දින සිට 2024.06.30 දින දක්වා ලැබුණු පැමිණිලි අතුරින් විමර්ශනය කිරීමට තීරණය කරන ලද පැමිණිලි 616 කට අදාළ ගොනු වල විමර්ශන කටයුතු විමර්ශන අංශය මගින් ආරම්භ කර සිදුකළ අතර, මීට පෙර කාලසීමාවන්හි ලැබුණු ගොනු ද ඇතුළුව 2024.06.30 දින වන විට විමර්ශන ගොනු 2,376 කට අදාළ විමර්ශන කටයුතු සිදුකරමින් පවතී.

3.2 වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්

අල්ලස් ලබාගැනීමේ හෝ ලබාදීමේ සිදුවීම් සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු සහ පැමිණිලිකරුගේ සහයෝගය ලැබෙන අවස්ථාවන්හිදී කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අදාල වරද සිදුවන අවස්ථාවේදී වැටලීමක් සිදුකර අත්අඩංගුවට ගැනීම් සිදුකෙරේ. 2024 මුල් මාස 06 තුළ එවැනි වැටලීම් 42 ක් සිදුකරන ලද අතර, ඉන් 16 ක් ඵලදායි විය. වැටලීම් වලදී සැකකරුවන් 26 දෙනෙකු අත්අඩංගුවට ගැනීමට හැකි විය.

3.3 2020 වර්ෂයේ සිට 2024 දෙවන කාර්තුව දක්වා සිදුකරන ලද වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්


වර්ෂය	සිදුකරන ලද ඵලදායී වැටලීම් සංඛ්‍යාව	වැටලීම් වලදී අත්අඩංගුවට ගත් සංඛ්‍යාව
2020	38	45
2021	33	36
2022	32	36
2023	43	57
2024 දෙවන කාර්තුව	16	26

04. නඩු පැවරීම්

විමර්ශන කටයුතු නිමකර නඩු පැවරීමට කරුණු පවතින ගොනු වලට අදාලව නඩු පැවරීමේ කාර්යය ඉටුකරනු ලබන්නේ කොමිෂන් සභාවේ නීති අංශය මගිනි. ඒ අනුව 2024 මුල් මාස 06 තුළ නඩු 25 ක් පවරා ඇති අතර අදාල කාලය තුල අවසන් වී ඇති නඩු සංඛ්‍යාව 35 කි.


4.1 2020 වර්ෂයේ සිට 2024.06.30 දක්වා පවරන ලද නඩු පිළිබඳ තොරතුරු

වර්ෂය	අල්ලස් නඩු	දූෂණ නඩු	අයුතු වත්කම් ඉපයීම් පිළිබඳ නඩු	වත්කම් බැරකම් හෙළි නොකිරීම් පිළිබඳ නඩු	එකතුව
2020	47	01	02	--	50
2021	58	02	--	02	62
2022	62	26	--	01	89
2023	55	03	02	--	60
2024.06.30 දක්වා	19	05	01	--	25



4.2 2020 වර්ෂයේ සිට 2024 වර්ෂයේ දෙවන කාර්තුව දක්වා අවසන් වූ නඩු පිළිබඳ තොරතුරු

වර්ෂය	අල්ලස් නඩු	දූෂණ නඩු	අයුතු වත්කම් ඉපයීම් පිළිබඳ නඩු	වත්කම් බැරකම් හෙළි නොකිරීම් පිළිබඳ නඩු	එකතුව
2020	52		03	--	55
2021	62		05	02	69
2022	90		--	07	97
2023	58	10	01	--	69
2024.06.30 දක්වා	33	02	--	--	35



4.3 2015 වර්ෂයේ සිට 2024.06.30 දක්වා පවරණ ලද නඩු සංඛ්‍යාව, අවසන් කරන ලද නඩු සංඛ්‍යාව සහ විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව

වර්ෂය	පවරන ලද නඩු			අවසන් කරන ලද නඩු			විත්තිකරුවන් වරදකරුවන් වූ සංඛ්‍යාව
	මහාධිකරණය	මහේස්ත්‍රාත් අධිකරණය	එකතුව	මහාධිකරණය	මහේස්ත්‍රාත් අධිකරණය	එකතුව	
2015	76	32	108	41	11	52	15
2016	43	44	87	26	08	34	15
2017	41	32	73	68	20	88	57
2018	36	16	52	84	26	110	64
2019	37	09	46	75	19	94	54
2020	42	08	50	46	09	55	28
2021	57	05	62	43	26	69	09
2022	77	12	89	64	32	96	22
2023	56	04	60	60	09	69	19
2024.06.30 දක්වා	21	04	25	23	12	35	11

4.4 2024.01.01 – 2024.06.30 දින දක්වා නඩු තීන්දු මගින් විත්තිකරුවන් වරදකරුවන් බවට පත්වූ අය පිළිබඳ විස්තර

අනු අංකය	ආයතනය	වරදකරුවන් වූ නිලධාරියාගේ තනතුර	වරදකරුවන් වූ සංඛ්‍යාව
01	පළාත් ආදායම් දෙපාර්තමේන්තුව - සබරගමුව	ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු	01
02	මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය	ධාවන කළමනාකරු	01
03		සිවිල් පුරවැසියන්	03
04	ලංකා විදුලි මණ්ඩලය	කාර්යාල කාර්ය සහයක	01
05	නවගම්පුර වසම	ග්‍රාම නිලධාරී	02
	ඩයගම ග්‍රාම නිලධාරී		
06	පොලිස් දෙපාර්තමේන්තුව	පොලිස් සැරයන්	01
		පොලිස් කොස්තාපල්	01
07.	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය- අත්තනගල්ල	ආරක්ෂක නිලධාරී	01
එකතුව			**11**

4.5 විභාග වෙමින් පවතින නඩු

2024.06.30 දින වනවිට අධිකරණවල නඩු 235 ක් විභාග වෙමින් පවතී. ඒ පහත පරිදිය.

මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 32

මහාධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 201

ත්‍රිපුද්ගල මහධිකරණයේ විභාග වන නඩු සංඛ්‍යාව - 02

05. නිවාරණය

අල්ලස හා දූෂණයෙහි අනිසි ප්‍රතිවිපාකයන් සහ අල්ලස හා දූෂණයට එරෙහිවීම මෙන්ම වැළැක්වීමේ ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීම සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, අධ්‍යාපන ක්ෂේත්‍රය හා මහජනතාව ඉලක්ක කරගනිමින් දීප ව්‍යාප්තව දූෂණ නිවාරණ වැඩ සටහන් පැවැත්වීමට කොමිෂන් සභාව පියවර ගෙන ඇත.

5.1 2024 දෙවන කාර්තුව තුළ පවත්වන ලද නිවාරණ වැඩ සටහන් පිළිබඳ සාරාංශගත තොරතුරු

වැඩ සටහන් පැවැත්වූ ආයතනය	සංඛ්‍යාව
රාජය/ පළාත් රාජය ආයතන වල නිලධාරීන් සඳහා	23
අර්ධ රාජ්‍ය ආයතන වල නිලධාරීන් සඳහා	16
පුද්ගලික ආයතන වල නිලධාරීන් සඳහා	2
වෙනත් පාර්ශවයන්පුද්ගලයන් සඳහා /	-
ජනමාධ්‍ය මගින් පවත්වන ලද වැඩ සටහන්	1
මුළු වැඩසටහන් සංඛ්‍යාව	**42**

2024.01.01 දින සිට 2024.06.30 දින දක්වා පවත්වන ලද මුළු නිවාරණ වැඩසටහන් සංඛ්‍යාව 79කි.

5.2 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ අනුග්‍රහය මත JURE ව්‍යාපෘතිය යටතේ නිලධාරීන්/පුද්ගලයන් සඳහා පවත්වන ලද නිවාරණ වැඩසටහන් (2024 දෙවන කාර්තුව)

අනු අංකය	දිනය	වැඩසටහන	ස්ථානය	වියදම (.රු)
01	03-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Araliya Red-Nuwara eliya	898,297.50
02	04-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Oakray Restaurant-Kandy	537,200.00
03	05-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Hotel swiss Dale-Mathale	358,355.00
04	29-Apr-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Public Officers	Slida-Colombo	374,850.00
05	11-May-24	1.4 Conduct training programms for integrity officers	Badulla Heritage-Uva Province	711,218.94

06	10/11/12-May-24	Train 400 Officers, one officer each from one institution under the three-day residential training programme to train trainers in all Government Institution	Araliya Grand Hills-Uva Province	2,974,420.00
07	12-May-24	Conduct quarterly sessions for sharing experience & best practices related to anti-corruption & Orevention with civil society-Railway station	Nuwara Eliya	24,405.00
08	18-May-24	Conduct training programms for integrity officers	Citrus-Southern Province	1,107,108.32
09	17/18/19-May-24	1Train 400 Officers, one officer each from one institution under the three-day residential training programme to train trainers in all Government Institution	Citrus-Southern Province	3,376,060.00
10	11-Jun-24	Conduct awareness program on integrity, anti corruption & values for education sector-Integrity programs For Schools	Jade Green Hambanthota	707,313.90
11	12-Jun-24	Conduct awareness program on integrity, anti corruption & values for education sector-Integrity programs For Schools	kanvel-Monaragala	650,583.90
12	13-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Rajarata Hotels Property Management	649,100.00
13	14-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Chilaw far Inn-Chilaw	513,040.00
14	15-Jun-24	Conduct awareness raising/ training programmes and on the job training for members of statutory boards	Taj Samudra	407,700.00
15	19-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Garden Beach-Kalutara	411,000.00

16	20-Jun-24	Conduct awareness program on integrity, anti corruption & values for education sector- Prevention programme for Educational Officers & School prefects	Green Grass Hotel & Restaurant-Jaffna	518,849.73
17	20-Jun-24	Conduct training programms for integrity officers	Ramada-Colombo	784,093.78
18	24-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Public Officers	SLIDA	355,000.00
19	25-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Polhena Grand Resort-Matara	528,893.00
20	26-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Jade Green Hambanthota	545,238.00
21	27-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Community Police Officers	Kethumathee Hotel & Banquet	560,575.00
22	29-Jun-24	Conduct awareness raising/training programmes & on-the job training opportunities for Public Officers	Asliya Jaoda-Kurunegala	512,920.00
23	28-29-30/June/2024	Train 400 Officers, one officer each from one institution under the three-day residential training programme to train trainers in all Government Institutions	Colombo	2,973,070.53
24		Anti-corruption and integrity to be introduced/ revised as a module in training programmes for public officers		24,912.50

06. මානව හා භෞතික සම්පත් කළමනාකරණය

කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටුකිරීමෙහිලා අවශ්‍ය භෞතික හා මානව සම්පත් කළමනාකරණය හා මූල්‍ය කළමනාකරණය පාලන අංශය සහ මුදල් අංශය මගින් සිදුකෙරේ. එම කටයුතු වල ප්‍රගතිය පහත පරිදි වේ.

6.1 මානව සම්පත් සංවර්ධනය - දේශීය පුහුණු කටයුතු (2024.04.01 – 2024.06.30 දක්වා කාල සීමාවට අදාළව)

අනු අංකය	පුහුණු වැඩ මුළුව	සහභාගි වූ නිලධාරීන්ගේ විස්තර	
		තනතුර	සංඛ්‍යාව
01	නිවාඩු ලිපිකරුවන්ගේ කාර්ය භාරය හා වගකීම්	සංවර්ධන නිලධාරී	02
02	ඡායාරූපකරණය සහ වීඩියෝකරණය පිළිබඳ පාඨමාලාව	විමර්ශන අංශ නිලධාරීන්	26
03	ඵලදායිතාවය හැඳින්වීම	කාර්යාල නිලධාරීන්	33
04	තත්ත්වකව පිළිබඳ හැඳින්වීම	කාර්යාල නිලධාරී	15

6.2 මානව සම්පත් සංවර්ධනය - විදේශීය පුහුණු පාඨමාලාවන් (2024.04.01 – 2024.06.30 දක්වා කාල සීමාවට අදාළව)

අනු අංකය	සම්මන්ත්‍රණයවැඩමුළුව/	පැවැත්වූ රට	කාල සීමාව	සහභාගී වූ නිලධාරීන්ගේ තොරතුරු	
				තනතුර	සංඛ්‍යාව
01	Safeguarding Sport From Competition Manipulation – focus on Investigation and Prosecution	Dubai-UAE	24.04.2024 - 25.04.2024	සහකාර අධ්‍යක්ෂ (නීති)	01
02	First Mid-Career Training programme for Island Service Officers of Sri Lanka	India	13.05.2024 - 24.05.202	ගණකාධිකාරී	01
03	UNODC UNADD COSP – Invitation to 13th EMIC, Resumed 15th IRG and 18th WGAR (States Parties)	Austria-Vienna	11.06.2024 - 14.06.2024	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01
04	Visit of Ningxia	China	25.06.2024 - 29.06.2024	අධ්‍යක්ෂ ජනරාල්	01

6.3 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ අනුග්‍රහය මත JURE ව්‍යාපෘතිය යටතේ කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩසටහන්

අනු අංකය	දිනය	වැඩසටහන	ස්ථානය	වියදම (.රු)
01	2024.04.18, 19 දෙදින	නීති නිලධාරීන් සඳහා පුහුණු වැඩ මුළුව	Pegasus	1,362,700.00
02	2024.04.24	විමර්ශන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව	Ramada -Alhambra Hotels - Colombo	852,000.00
03	2024.06.08	නීති නිලධාරීන් සඳහා පුහුණු වැඩ මුළුව	Taj Samudra	357,360.68
04	2024.06.17, 18, 19	විමර්ශන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව	Waskaduwa Beach Resort	1,620,000.00
05	2024.06.24, 25	නීති නිළධාරීන් සඳහා ආචාර ධර්ම පද්ධතිය හඳුන්වාදීමේ වැඩමුළුව	Hotel Janaki	546,000.00

6.4 2024.06.30 දින වන විට මූල්‍ය ප්‍රගතිය

Expenditure Subject No.	Finance Code	Category/Object/Item Description	Budgetary Allocation 2024	Expenditure as at 30.06.24
010-1-1-0-1001	11	Salaries and Wages	223,000,000.00	102,949,718.49
010-1-1-0-1001	21	Salaries and Wages	16,800,000.00	8,400,000.00
010-1-1-0-1002	11	Overtime and Holiday Payments	7,560,000.00	3,258,126.83
010-1-1-0-1003	11	Other Allowances	235,000,000.00	149,138,244.65
010-1-1-0-1101	11	Travelling Expenses - Domestic	4,800,000.00	1,781,372.50
010-1-1-0-1102	11	Travelling Expenses - Foreign	10,000,000.00	2,725,549.39
010-1-1-0-1201	11	Stationary and Office Requisites	20,000,000.00	4,864,155.30
010-1-1-0-1202(002)	11	Fuel Allowance	10,700,000.00	6,536,530.00
010-1-1-0-1202(009)	11	Fuel for Pool Vehicles	40,100,000.00	5,674,547.00
010-1-1-0-1202(010)	11	Fuel for Other Purposes	100,000.00	0.00
010-1-1-0-1203(002)	11	Uniforms	200,000.00	156,000.00
010-1-1-0-1301	11	Vehicles	25,000,000.00	13,332,043.46
010-1-1-0-1302	11	Plant and Machinery	9,000,000.00	1,990,958.07
010-1-1-0-1303	11	Building and Stuctures	5,000,000.00	324,337.10
010-1-1-0-1304	11	Software Maintenance	2,000,000.00	150,000.00
010-1-1-0-1401	11	Transport	3,600,000.00	1,477,500.00
010-1-1-0-1402	11	Postal and Communication	9,600,000.00	3,616,405.20
010-1-1-0-1403	11	Electricity and Water	34,000,000.00	12,416,290.07
010-1-1-0-1404	11	Rent and Local Taxes	2,000,000.00	0.00
010-1-1-0-1405	11	Cleaning and Janitorial Services	12,000,000.00	5,077,144.20
010-1-1-0-1407	11	Security Services	5,500,000.00	1,177,100.00

010-1-1-0-1408	11	Lease Rental for Vehicles procured Under Operational Leasing Other	55,100,000.00	6,534,295.38
010-1-1-0-1409(138)	11	Machinery and Office Equipment Service Agreements	9,500,000.00	993,099.80
010-1-1-0-1409(139)	11	Vehicle Insurance	2,000,000.00	892,550.96
010-1-1-0-1409(140)	11	Miscellaneous Services Expenditure	1,800,000.00	930,438.34
010-1-1-0-1505	11	Subscriptions and Contributions Fee	5,500,000.00	0.00
010-1-1-0-1506	11	Property Loan Interest to Public Servants	1,200,000.00	214,353.63
010-1-1-0-2001	11	Buildings and Stuctures	30,000,000.00	1,884,484.50
010-1-1-0-2003	11	Vehicles	1,000,000.00	0.00
010-1-1-0-2102	11	Plant, Machinery and Equipment	2,000,000.00	383,693.11
010-1-1-0-2103	11	Furniture and Office Equipment	12,000,000.00	4,569,992.00
010-1-1-0-2401	11	Staff Training	2,900,000.00	67,000.00
010-1-1-3-2509	11	Bribery and Corruption Awarenees Programme for the Public (Other)	13,750,000.00	370,446.91
010-1-1-4-2509	13	EU - Sri Lanka Justice Reform Programme - JURE (UNDP) - Other	35,350,000.00	24,558,627.47
010-1-1-5-2509	11	Facilitation of implementing Anti-	25,000,000.00	13,187,100.00
		Corruption Act		
Total			873,060,000.00	388,529,969.43

6.5 2024.06.30 දිනට සාරාංශගත මූල්‍ය ප්‍රගතිය

	අයවැය ප්‍රතිපාදනය -2024	2024.06.30 දිනට වියදම
පුනරාවර්තන වියදම	751,060,000.00	335,646,874.22
ප්‍රාග්ධන වියදම	122,000,000.00	52 ,883,095.21
එකතුව	873,060,000.00	388,529,969.43

6.6 කාර්ය මණ්ඩල විස්තර

2024.06.30 දිනට සේවක සංඛ්‍යා පිළිබඳ තොරතුරු

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	63	28
තෘතීයික	219	07
ද්විතීයික	241	115
ප්‍රාථමික	140	81
එකතුව	663	231
ශ්‍රී ලංකා පොලිසිය මගින් ද්විතියික පදනම් මත සේවය කරන විමර්ශන නිලධාරීන්	283	225
මුළු එකතුව	946	456